# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සඳහා සමබර කාර්ය සාධන ලකුණු ක්‍රමවේදය (BSC) පදනම් කරගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) රාමුවක් සමාලෝචනය, සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම පිණිස උපදේශන සේවා සැපයීම සඳහා යෝජනා කැඳවීම**

## ප්‍රසම්පාදන අංකය : TRC/ADM/01/02/03/11

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය සඳහා සමබර කාර්ය සාධන ලකුණු ක්‍රමවේදය (Balanced Scorecard) පදනම් කරගත් ප්‍රධාන කාර්යය සාධන දර්ශක (KPIs) රාමුවක් සමාලෝචනය, සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමටත්, එම ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුමක් ඉදිරිපත් කිරීමටත් අදාළව උපදේශන සේවාවක් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම්ලත් උපදේශකයින්ට ආරාධනා කරනු ලැබේ.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන උපදේශකයින්ට රු. 1,000/- ක නැවත නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් 2025.10.27 දින සිට 2025.11.10 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන හා ආයතනික කටයුතු අංශයෙන් යෝජනා ඉල්ලීමේ (RFP) ලිපි ලේඛන ලබා ගත හැක.

උපදේශකයින් තෝරාගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශ 2007 හි නියමයන් ප්‍රකාරව තනි අදියර ද්විත්ව කවර ලංසුකරණ පටිපාටිය යටතේ යෝජනා භාරගනු ලැබේ.

"**KPIs සකස් කිරීම සඳහා යෝජනා ඉල්ලීම - තාක්ෂණික යෝජනා**" සහ "**KPIs සකස් කිරීම සඳහා යෝජනා ඉල්ලීම - මූල්‍ය යෝජනා**" යනුවෙන් ලියුම් කවරවල ඉහළ වම් කෙළවරේ සඳහන් කර, එම යෝජනා දෙක වෙන වෙනම කවරවල දමා නැවත කවර දෙකම එක් ලියුම් කවරයක බහා එවිය යුතුය. එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**KPIs සකස් කිරීම සඳහා යෝජනා ඉල්ලීම - තාක්ෂණ සහ මූල්‍ය යෝජනා**" යනුවෙන් සඳහන් කළ යුතුය.

යෝජනා භාරගැනීමට නියමිත අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි, සභාපති, දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 වෙත ලියාපදිංචි තැපැල මගින් එවීමෙන් හෝ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන හා ආයතනික කටයුතු අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලීමෙන් යෝජනා ඉදිරිපත් කරන මෙන් ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

යෝජනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය හා වේලාව : 2025.11.11 දින ප.ව. 2.00

**සභාපති,**
**දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**